ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා වන නිදහස් සටන් මධ්‍යස්ථානය
ஜனநாயகத்தைப் பாதுகாப்பதற்கான சுதந்திரப் போராட்ட மையம்
FREE ACTION CENTRE FOR THE PROTECTION OF DEMOCRACY

23/09/2026

විපක්ෂ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා
නායක
සමගි ජන බලවේගය
592, කෝට්ටේ පාර
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි,

**ප්‍රජාතන්ත්‍රවාදී එකමුතුව, විපක්ෂයේ ඉදිරි ගමන සහ නායකත්වයේ වගකීම පිළිබඳව**

22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ඔබතුමා සහ සමගි ජන බලවේගය පාර්ලිමේන්තුව තුළත් නීතිමය ක්ෂේත්‍රය තුළත් දක්වා ඇති විරෝධය පිළිබඳව අපට පැහැදිලි අවබෝධයක් තිබේ. එමෙන්ම, වෙනස් දේශපාලන මත සහ අනන්‍යතාවයන්ට ගරු කරමින් පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී එකමුතුවක් ගොඩනැගීම මේ මොහොතේ අත්‍යාවශ්‍ය බව අපි විශ්වාස කරමු.

එම අරමුණින්, ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය සහ අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු හමුවේ විපක්ෂයේ දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන පොදු වේදිකාවකට ගෙන ඒම සඳහා නිදහස් සටන් මධ්‍යස්ථානය ලෙස අප මැදිහත් වූවෙමු.

එහි දී සමගි ජන බලවේගය නියෝජනය කරමින් මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නියෝජිතයන් අප සමඟ සාකච්ඡා කළ අතර, ඒකාබද්ධ වැඩපිළිවෙළක් පිළිබඳ එකඟතාවකට පැමිණියේය. සැප්තැම්බර් 17 දින පැවති ඒකාබද්ධ නියෝජිත හමුවට ද ඔබතුමා ගේ පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අජිත් පී. පෙරේරා සහ මුජිබර් රහුමාන් යන මහත්වරු සහභාගී වූහ.

එම සාකච්ඡාවට සහභාගී වූ පාර්ලිමේන්තුව නියෝජනය කරන සහ නොකරන විපක්ෂ දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන අතර ඇතිවූ එකඟතාව මත “22 ජන බලයෙන් පරදවමු” යන තේමාව යටතේ සැප්තැම්බර් 24 දින ඒකාබද්ධ මහජන විරෝධතාවක් පැවැත්වීමට තීරණය කෙරිණි.

අප එය සලකන්නේ එක් පක්ෂයක හෝ කණ්ඩායමක දේශපාලන වැඩසටහනක් ලෙස නොව, 22 වන සංශෝධනයට විරුද්ධ විවිධ පාර්ශවයන්ට තම දේශපාලන අනන්‍යතාව සහ ස්වාධීනත්වය රැකගෙන සහභාගී විය හැකි පොදු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගයක් ලෙසය.

එවැනි පසුබිමක, ඔබ තුමාගේ පක්ෂය නියෝජනය කරන බව සඳහන් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සහ සංවිධායකවරයෙකු විසින් මෑතක දී පැවැත්වූ මාධ්‍ය හමුවක දී අනෙකුත් විපක්ෂ දේශපාලන කණ්ඩායම්, වෘත්තීය සමිති සහ සිවිල් සංවිධානවල සහභාගීත්වය සම්බන්ධයෙන් කළ බව වාර්තා වන ප්‍රකාශ අපගේ අවධානයට ලක්ව තිබේ.

153/20, නාවල පාර කොළඹ 05
153/20, Nawala Road Colombo 05
153/20, நாவல வீதிஇ கொழும்பு 05
0772 900 900
facfpod@gmail.com

එම ප්‍රකාශ ඔබ තුමාගේ හෝ සමගි ජන බලවේගයේ නිල ස්ථාවරය නියෝජනය කරන බවට අපි පූර්ව නිගමනයකට නොපැමිණියෙමු. එහෙත් ඒවා සැප්තැම්බර් 17 දින ඇති කරගත් පොදු එකඟතාව සමඟ ගැළපෙන්නේ කෙසේද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය බව අපි විශ්වාස කරමු.

මෙහි දී අපට වැදගත් වන්නේ පුද්ගලයෙකුට දොස් පැවරීම හෝ පක්ෂයක් අපහසුතාවට පත් කිරීම නොවේ. අපගේ අවධානය යොමු වන්නේ මෙතෙක් විශාල උත්සාහයකින් ගොඩනැගුණු පොදු ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය ආරක්ෂා කර ගැනීම කෙරෙහිය.

පොදු එකඟතාවක් ඇති කර ගැනීම මෙන්ම, එය ආරක්ෂා කිරීම ද නායකත්වයේ වගකීමකි.

විවිධ පාර්ශවයන්ගේ දායකත්වය අවතක්සේරු වන බවට හැඟීමක් ඇති වුවහොත්, එයින් අවසානයේ දුර්වල වන්නේ එක් පක්ෂයක් හෝ සංවිධානයක් නොව, අප සියලු දෙනා එක්ව ගොඩනගන පොදු ක්‍රියාමාර්ගයයි. එසේම පැහැදිලි කිරීමක් නොමැති තැන අනවශ්‍ය අනුමාන සහ සැකයන් බිහිවීමටද ඉඩ තිබේ.

ඒ නිසා මේ මොහොතේ වඩා වැදගත් වන්නේ එවැනි අනුමාන වර්ධනය වීමට ඉඩ දීම නොව, කරුණු මත පදනම් වූ පැහැදිලි ස්ථාවරයක් තුළින් අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කිරීමයි.

එබැවින්, ඔබ තුමාගෙන් අප ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ,

1. අදාළ සිදුවීම සහ ප්‍රකාශ සම්බන්ධයෙන් කරුණු සොයා බලා ඒ පිළිබඳව පක්ෂයේ නිල ස්ථාවරය පැහැදිලි කරන ලෙසත්;

2. එම ප්‍රකාශ සමගි ජන බලවේගයේ නිල ස්ථාවරය නියෝජනය නොකරන්නේ නම්, ඒ බව පැහැදිලි කර සැප්තැම්බර් 17 දින ඇති කරගත් පොදු එකඟතාවට පක්ෂයේ කැපවීම තහවුරු කරන ලෙසත්;

3. සැප්තැම්බර් 24 දින පැවැත්වෙන "22 ජන බලයෙන් පරදවමු" මහජන ක්‍රියාමාර්ගය එක් පක්ෂයකට සීමා වූ වැඩසටහනක් නොව, එකඟ වූ සියලු දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, වෘත්තීය සමිති, බහුජන සංවිධාන සහ පුරවැසියන්ට සමාන ගෞරවයකින් සහභාගී විය හැකි පොදු ප්‍රජාතන්ත්‍රවාදී වේදිකාවක් ලෙස පවත්වා ගෙන යාමට සහාය දෙන ලෙසත්;

4. අනෙකුත් පාර්ශවයන්ගේ දේශපාලන ස්වාධීනත්වය හෝ දායකත්වය අවතක්සේරු වන ආකාරයේ ප්‍රකාශ සහ ක්‍රියාකාරකම් හේතුවෙන් පොදු එකමුතුවට හානි නොවන පරිදි අවශ්‍ය පක්ෂ අභ්‍යන්තර සම්බන්ධීකරණය සහ මග පෙන්වීම ලබා දෙන ලෙසත්;

5. 22 වන සංශෝධනයෙන් ඔබ්බට ද ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය සහ ආයතනික ස්වාධීනත්වය සුරැකීම සඳහා විපක්ෂයේ දේශපාලන හා සිවිල් බලවේග අතර ගෞරවාන්විත සහ සමාන පදනමක පොදු සංවාදයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය දේශපාලන පරිසරය තහවුරු කරන ලෙසත් ය.

ඔබතුමා දේශපාලන කතිකාව තුළ බුදුරජාණන් වහන්සේගේ දේශනා සහ බෞද්ධ දර්ශනයේ මූලධර්ම නිරන්තරයෙන් උපුටා දක්වන බැවින්, අවසානයේ ඒ හා සම්බන්ධ එක් අදහසක් ද සිහිපත් කිරීමට කැමැත්තෙමු.

බෞද්ධ දේශනාවේ සඳහන් "අත්තුක්කංසන–පරවම්භන" යන අදහස තුළින් සිහිපත් කෙරෙන්නේ තමන් උසස් කරමින් අනෙකා පහත් කිරීමෙන් වැළකීමේ වැදගත්කමයි.

එය දේශපාලනයට ද අදාළ වටිනා මූලධර්මයකි.

විශේෂයෙන්ම පොදු අරමුණක් වෙනුවෙන් විවිධ පාර්ශවයන් එකට පැමිණෙන අවස්ථාවක, එක් පාර්ශ්වයක වැදගත්කම තහවුරු විය යුත්තේ අනෙක් පාර්ශවයන්ගේ වැදගත්කම අඩු කිරීමෙන් නොවේ. එකිනෙකාගේ අනන්‍යතාව, ගෞරවය සහ දායකත්වය පිළිගැනීමෙන් පමණක් කල්පවත්නා පොදු එකඟතාවක් ගොඩනැගිය හැකිය.


අද අවශ්‍ය වන්නේ එක් පක්ෂයක් අනෙක් පක්ෂවලට වඩා විශාල කර පෙන්වීම නොව, පක්ෂ සියල්ලටම වඩා ප්‍රජාතන්ත්‍රවාදය විශාල කර තැබීමයි.

අපගේ අරමුණ වන්නේ එකිනෙකාගේ දේශපාලන ස්වාධීනත්වය සහ වෙනස්කම් පිළිගනිමින්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්, නීතියේ ආධිපත්‍යය සහ ආයතනික ස්වාධීනත්වය වැනි පොදු කාරණාවල දී එකට සිටිය හැකි දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමයි.

එබැවින්, මෙම කරුණු සම්බන්ධයෙන් ඔබතුමා ගේ අවධානය යොමු කර, පොදු එකඟතාව සහ අන්‍යෝන්‍ය ගෞරවය ආරක්ෂා වන ආකාරයෙන් අවශ්‍ය මැදිහත් වීම සිදු කරනු ඇතැයි අපි ගෞරවයෙන් අපේක්ෂා කරමු.

මෙය කිසිදු පුද්ගලයෙකුට හෝ දේශපාලන පක්ෂයකට එරෙහි ප්‍රකාශයක් නොව, පොදු එකඟතාව, අන්‍යෝන්‍ය ගෞරවය සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගයේ විශ්වසනීයත්වය ආරක්ෂා කර ගැනීම සඳහා කරන ගෞරවනීය ආයාචනයක් ලෙස සලකන ලෙස ඉල්ලා සිටිමු.

ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා වන නිදහස් සටන් මධ්‍යස්ථානයේ
කැඳවුම්කාර මණ්ඩලය වෙනුවෙන්,



........................................................
ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න

කැඳවුම්කාර මණ්ඩලය

1. ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න - ෆ්‍රී ලෝයර්ස් සංවිධානය
2. ජ්‍යෙෂ්ඨ නීතිඥ ශිරාල් ලක්තිලක - දිනන දකුණ සාමූහිකය
3. හිටපු පලාත් සභා මන්ත්‍රී නිශාන්ත ශ්‍රීවර්ණසිංහ - ජාතික අවධි සභාව
4. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ ප්‍රේමනාත් සී දොලවත්ත - සත්‍ය ගවේශකයෝ සංවිධානය
5. සම බිම පක්ෂ නායක දීප්ති කුමර ගුණරත්න
6. වෘත්තීයවේදී රවී කුමුදේශ් - ජාතික වෘත්තීය වේදීන්ගේ මධ්‍යස්ථානය
7. නීතිඥ නන්ද මුරුත්තෙට්ටුවේගම - Development Watch
8. වෘත්තීයවේදී සමන් රත්නප්‍රිය - වෘත්තීය සමිති සහ වෘත්තීයවේදීන්ගේ ජාතික මධ්‍යස්ථානය
9. වෘත්තීයවේදී තුසිත පෙරේරා - ජාතික සිවිල් සංවිධාන සාමූහිකය
10. වෘත්තීයවේදී උදේනි දිසානායක - කළමනාකරණ සහායක වෘත්තීය සමිතිය
11. නීතිඥ ආශා කහවිට - ෆ්‍රී ලෝයර්ස් සංවිධානය
12. බන්දුල චන්ද්‍රසේකර - ජාතික විද්වත් සභාව